ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකː 2477424, 2477423, 2477311
ෆැක්ස්ː 2346257, 2477739
ඊ-මේල්ː dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියː www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
|---|---|
| දිනය | **2016 නොවැම්බර් මස 21 වැනි දින** |

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විස්තීර්ණ ණය පහසුකම යටතේ එ.ජ.ඩොලර් මිලියන 162.6 ක දෙවන වාරිකය මුදා හැරීම.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාව ලබාගත් තුන් අවුරුදු විස්තීර්ණ ණය පහසුකමෙහි ප්‍රථම සමාලෝචනය සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර වි.ගැ.හි. මිලියන 119.894 ක (ආසන්න වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 162.6 ක) දෙවැනි වාරිකය 2016 නොවැම්බර් 18 දින මුදාහරින ලදී.

විස්තීර්ණ ණය පහසුකමෙහි ප්‍රධාන අරමුණ වනුයේ ගෙවුම් තුලනය ශක්තිමත් කිරීම සහ රජයේ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා උපකාර කිරීමයි. සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරය කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත පිරිස විශේෂයෙන්ම, වෙළඳපොළ විශ්වාසය වර්ධනය කිරීමට සහ විදේශීය අංශය මත වූ පීඩනය අඩු කිරීමට දායක වන ලද රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය අරමුණු කර ගත් ක්‍රියාමාර්ග සහ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ඇගයීමට ලක් කළේය. දූත පිරිස, ජූනි මස අගභාගය දක්වා වූ සියලුම ප්‍රමාණාත්මක කාර්ය සාධන දර්ශක සපුරා ගැනීම සඳහා රජය සහ අනෙකුත් ආයතන විසින් ගනු ලැබූ උත්සාහයන් අගය කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලයේ සාමාජිකයින් ද,

දැනට ක්‍රියාත්මක වන විස්තීරණ ණය පහසුකම යටතේ වූ සපුරා ගැනීම් පිළිබඳව ප්‍රසාදය පළ කර ඇත.

දෙවන වාරිකය මුදා හැරීමත් සමඟ විස්තීර්ණ ණය පහසුකම යටතේ ශ්‍රී ලංකාව මෙතෙක් ලබාගත් මුළු ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 325 ක් විය. විස්තීර්ණ ණය පහසුකම තවදුරටත් පවත්වා ගැනීම රටේ වෙළඳපොළ විශ්වාසය ශක්තිමත් කිරීම, තරඟකාරිත්වය වැඩි කිරීම, විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම, සාර්ව ආර්ථික ස්ථායීතාව වර්ධනය කිරීම සහ එමගින් මැදිකාලීන වර්ධන අපේක්ෂාවන් සපුරා ගැනීමට දායක වනු ඇත.